**ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම.

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවද, විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා දූත මණ්ඩලවල වාර්තා නොකළ රු.10,884,464 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දූත මණ්ඩල මඟින් බැරකම් වාර්තා කිරීමේදී සිදුව ඇති මඟහැරීම් නිසා මෙසේ සිදුවී ඇතත් ඉදිරියේදී නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. |

**1.6.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ)** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් අත්තිකාරම් ලැබීම්, මාසික ගිණුම් සාරාංශ සමඟ සැසඳීමේදී රු.9,934,037 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවද, අමාත්‍යාංශයේ අග්‍රිම ගැලපුම් ගිණුම අනුව එම වෙනස රු.9,896,124 ක් වශයෙන් ගලපා තිබීම හේතුවෙන් රු.37,913 ක වෙනසක් නිරීක්ෂණය විය. | අත්තිකාරම් ලැබීම් මාසික ගිණුම් සාරාංශ සමඟ වෙනස්කම් ඇති නොවිය යුතු වීම. | මාසික පරිගණක ගිණුම් වාර්තාවල සිදුවන වැරදි නිවැරදි කිරීම් ජ'නල් සටහන් මඟින් අවසන් භාණ්ඩාගාර මුද්‍රිත ලබාගෙන මූල්‍ය ප්‍රකාශන වාර්තා පිළියෙල කර ඇති නිසා වෙනසක් නොමැත. |
| **(ආ)** විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අනෙකුත් වැය ශීර්ෂ වෙනුවෙන් දරා ඇති වියදම රු.778,863,553 ක් වශයෙන් අග්‍රිම ගැලපුම් ගිණුමට ගලපා තිබුණද, මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.786,835,573 ක් වූයෙන් රු.7,972,022 ක වෙනසක් නිරීක්ෂණය විය. | අග්‍රිම ගැලපුම් ගිණුම නිවැරදිව ගැලපීමට කටයුතු කළ යුතු වීම. | අග්‍රිම ගැලපුම් ගිණුම පිළිබඳ විශේෂ අවධානය යොමුකර වෙනස්කම් ඇත්නම් ඉදිරියේදී ගැලපීමට කටයුතු සිදුකරමි. |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ)** සාමාලෝචිත වර්ෂයේදී විකුණන ලද වාහන 05ක වටිනාකම රු.11,900,000 ක් වුවද වාහන 06 ක වටිනාකම වු රු.13,900,00 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කර තිබුණි. | අපහරණ අගය ලෙස අදාළ වාහනවල පිරිවැය වටිනාකම ඇතුළත් කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |

| | | |
|---|---|---|
| **(ආ)** සමාලෝචිත වර්ෂයේ දී දූත මණ්ඩල 03 ක් විසින් අපහරණය කරන ලද පිරිවැය රු.13,875,228 ක් වූ වාහන 03 ක විකුණුම් වටිනාකම වූ රු.2,156,731 ක මුදල එම වාහනවල අපහරණ අගය ලෙස හඳුනාගෙන තිබුණි. | අපහරණය කරන ලද වාහන 03 හි පිරිවැය වටිනාකම අපහරණ අගය ලෙස හඳුනා ගත යුතු වීම. | ඉදිරියේදී සොයාබලා කටයුතු කිරීමට පියවර ගනිමි. |

**1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ වාහන විකිණීමෙන් ලද රු.10,020,720 ක මුදල ඇතුළත් කර නොතිබුණි. | වාහන විකුණුම්වලින් ලද මුදල, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වීම. | වාහන විකුණුම්වලින් ලැබූ මුදල ආයෝජන ක්‍රියාකාරකම් තුළ ඇතුළත් වී නොමැති බව පිළිගනිමි. ඒ මුදල් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ඇතුළත් වී ඇති බව දන්වමි. ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව දත්ත ඇතුළත් කිරීමට පියවර ගනු ඇත. |
| (ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ දැක්විය යුතු වීම. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව දත්ත ඇතුළත් කිරීමට පියවර ගනු ඇත. |
| (ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ගණනය කිරීමේදී ඉකුත් වර්ෂයේ නොපියවූ අග්‍රිම ශේෂය වූරු.145,391,699 ක මුදල හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනස වූ රු.726,968,663 ක මුදල ගැලපීමට | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267 / 2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛ ප්‍රකාරව නිසි පරිදි ගැලපීම් සිදුකර ඇත. |

කටයුතු කර තිබුණි.

### 1.6.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කළ, සේවය අවසන් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු.2,326,566 ක් වූ අතර, ඉන් වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂවල එකතුව රු.1,259,997 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 සහ 3 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ස්ථාන මාරුවී ගොස් ඇති නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. තවද, අනෙකුත් නිලධාරීන් සම්බන්ධයෙන් වූ අදාළ ඇපකරුවන්ගෙන් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂ කපා හැරීමට දැනටමත් භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශයේ වූ වර්ෂ 05 කට වැඩි හඳුනා නොගත් ණය ශේෂ එකතුව රු.1,515,668 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | ශේෂයන් මෙම වර්ෂය තුළ නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. |

**1.6.6. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව විදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් හානි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘති අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව විදේශ දූත මණ්ඩල සම්බන්ධයෙන් හානි ලේඛනයක් සකස් කර පවත්වාගෙන යාම හා එය යාවත්කාලීන කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට සටහන් කර ගන්නා ලදී. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **සලසා තිබූ ප්‍රතිපාදන නිෂ්ඵල වීම**<br>වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර තිබුණු රු.මිලියන 3.66ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. | මෙම අමාත්‍යංශයේ කටයුතු ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශ දූත මණ්ඩල 67ක සිදු කරනු ලබයි. එම නිසා පවත්නා සංකීර්ණතාවය, අවශ්‍යතාවල විවිධත්වය සහ විනිමය උච්චාවචනයන්ට භාජනය වීම නිසා සිදුවන බලපෑම මත වියදම් නිශ්චිත වශයෙන් පුරෝකථනය කිරීමට අපහසු වුවද හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු සකස් කර ඇත. |

(ආ) **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

-------------------------------

| | | |
|---|---|---|
| වැය විෂයන් 07 ක් සඳහා රු.මිලියන 325 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා, ඉතිරිය සලසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 54 ක සිට සියයට 78 ක් අතර පරාසයක් ගෙන තිබුණි. | -එම- | -එම- |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයේ ඇතුළත් වැය විෂයයන් 31 ක් සඳහා සලසා තිබූ රු.මිලියන 9,925 ක ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 244 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි. | ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා බැරකම් ඇති කර නොගත යුතු වීම. | අමාත්‍යාංශයේ ඒ ඒ අංශවල හා සියලුම විදේශ දූත මණ්ඩල විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදි නොවීම සහ මගහැරීම්, බැඳීම් හෝ බැරකම් නිසියාකාරව හඳුනා නොගැනීම යන කරුණු මත සියලුම බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශයේ ඇතුළත් කිරීමට අපහසු වී ඇත. ඉදිරියේ දී එම අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විදේශ දූත මණ්ඩලයන්හි 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 ක සිට වර්ෂ 27 ක් දක්වා වූ කාල පරාසයක් තුළ නොපියවූ අත්තිකාරම් ශේෂය | විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම මුදල් නැවත අයකර ගත හැකි වන්නේ නිවාස පදිංචියෙන් ඉවත් වූ විටය. පවතින ගිණුම් ක්‍රමය නිසා අත්තිකාරම් ලෙස වාර්තාවන අතර |

| | | |
|---|---|---|
| රු.මිලියන 392.37 ක් විය. එහි ඇතුළත් පදිංචි සහ පදිංචි නොවූ නිවාස සඳහා ආරක්ෂිත ඇප තැන්පතු රු. මිලියන 342.39 ක් හා අනිකුත් තැන්පතු රු. මිලියන 49.98 ක් විය. | | භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම වාර්තා කරන ආකාරය සම්බන්ධයෙන් නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කරමින් පවතී. අනිකුත් තැන්පතු අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතී. |

**2.4 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි565 (5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා මාසික තැන්පතු සාරාංශ පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | දැනට ක්‍රියාත්මක වන ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන (On – line) ක්‍රමයක් නොවන හෙයින් තානාපති කාර්යාල 67 ක පොදු තැන්පත් ගිණුම් හි මාසික සාරාංශයක් මු.රෙ.565(5) ප්‍රකාරව ඉදිරිපත් කිරීම අපහසු වී ඇත. යාවත්කාලීන (On – line) ගිණුම් ක්‍රමයකට පරිවර්තනය වීමට මේ වන විට කඩිනමින් කටයුතු කෙරමින් සිටින බැවින් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ඉදිරියේදී හැකි වන බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඕස්ට්‍රේලියාවේ පිහිටි කැන්බරා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ඕස්ට්‍රේලියානු ඩොලර් 2,589,000 ක් වටිනා ගොඩනැගිලි 02 ක් 2012 වර්ෂයේ සිට සහ 2007 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. ඉන් එක ගොඩනැගිල්ලක් මහ කොමසාරිස්වරයාගේ නිල නිවස බවට පරිවර්තනය කිරීමට 2017 සැප්තැම්බර් 26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා 2018 වර්ෂයේ අයවැය මඟින් රු.මිලියන 260 ක ප්‍රතිපාදන ද ලබාදී තිබුණි. එහෙත් ඒ සම්බන්ධයෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. | කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදන හා වත්කම් උපයෝජනය කළ යුතු වීම. | 2019 ජූනි 26 දිනැති අංක අමප/19/1616/111/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විවෘත මිල ගණන් කැඳවීම මඟින් ශ්‍රී ලංකාවෙන් හෝ අදාළ රටෙන් කොන්ත්‍රාත්කරුවකු තෝරා ගන්නා ලෙස නියෝග නිකුත් කර ඇත. |
| (ආ) | කැනඩාවේ ටොරොන්ටෝ සහ ඔටාවාවල පිහිටි දූත මණ්ඩල කාර්යාල හා නිල නිවාස සඳහා (ඔටාවා නිල නිවස හැර) කුලී ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 93.0 ක් වැය කර තිබුණි. එම වියදම් අවම කර ගැනීමට විකල්පයක් වශයෙන් දේපල මිලදී ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. | දේපල මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු වීම. | ටොරොන්ටෝ කොන්සියුලර් ජනරාල් කාර්යාලය සඳහා දේපල මිලදී ගැනීම කළ යුතු බවට හඳුනාගෙන ඇත. මේ සඳහා තවදුරටත් අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතය. |
| (ඇ) | විකල්ප ක්‍රියාමාර්ගයන් පිළිබඳව සොයා බැලීමකින් තොරව වසර 100 ක් පමණ පැරණි කැනඩාවේ ඔටාවා මහ කොමසාරිස් නිල නිවස අලුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 26.71 වැය කර තිබුණි. | නව නිල නිවසක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | තානාපති නිල නිවසක් හා තානාපති කාර්යාලයක් මිලදී ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට අවශ්‍ය බැවින්, ඒ අනුව ඉදිරි තීරණ |

ගැනීමට බලාපොරොත්තු වේ.

**3.2 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විදේශ දූත මණ්ඩලවලට අදාළ සිද්ධීන් 46 ක පැවති රු.මිලියන 77.16 ක් වූ පාඩු හා අත්හැරීම් සඳහා වර්ෂ 05 ක් ඉක්මවා පැවතියද විධිමත් පරිදි ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි පරීක්ෂණ සිදු කර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. | අදාළ වට්නාකම් තනි තනි වශයෙන් හඳුනාගෙන අදාළ තානාපති කාර්යාල මඟින් තොරතුරු කැඳවා මු.රෙ. 106 හා 113 ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |
| (ආ) | විවිධ සිද්ධීන් හේතුවෙන් අමාත්‍යාංශයට ලැබිය යුතු බවට වාර්තා වී ඇති රු.මිලියන 1.09 ක මුදල මු.රෙ.104 ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ පවත්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අලාභ හානි පිළිබඳව තව දුරටත් සොයා බලා කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| (ඇ) | විවිධ කරුණු හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී ඇති එකතුව රු.මිලියන 9.89 ක මුදලක් පාඩු හා අත්හැරීම් යටතේ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අය නොවූ නිවාස ආරක්ෂිත ඇප තැන්පතු සම්බන්ධ සියළු විස්තර අදාළ තානාපති කාර්යාලයෙන් ලබා ගෙන එය මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට මේ වනවිට කටයුතු කෙරෙමින් පවතී. වාහන අනතුරු, නොපියවූ අත්තිකාරම් යනාදිය ද සම්බන්ධයෙන් එපරිදිම විස්තර ලබා ගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිරවුල් කිරීමට කටයුතු කෙරෙමින් පවතියි. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුලී නිවසට අදාළව කුලී හිමියා සමඟ එළැඹි ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන්, දූත මණ්ඩල කාර්යාලයක් විසින් 2018 මාර්තු 05 දින කුලී හිමියා වෙත රු.724,482 (ඇ.ඩො.4622) ක් ගෙවා තිබුණි. | අදාළ මුදල වගකිවයුතු නිලධාරියාගෙන් අයකරගත යුතු වීම. | රු.724,482 ක මුදල අදාළ නිලධාරියා හෝ වෙනත් පාර්ශවයක ප්‍රමාද දෝෂයකින් සිදුවූවක් නොවේ. |
| (ආ) | විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් ඉටුකරනු ලබන කොන්සියුලර් කාර්යයන් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු 2018 මාර්තු 01 දින සිට සංශෝධනය කර ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර තිබුණි. එහෙත් එම ගැසට් නිවේදනයේ සඳහන් මුදල් ඒකක භාවිතා කරනු නොලබන රටවල්වල අදාළ මුදල් ඒකකවලට පරිවර්තනය කළ යුතු ආකාරය පිළිබඳ පොදු ක්‍රමවේදයක් නිශ්චයකර නොතිබීම හේතුවෙන් විවිධ නිර්ණායක පදනම් කරගෙන පරිවර්තිත අනුපාත තීරණය කර තිබුණි. | පොදු ක්‍රමවේදයක් අනුව පරිවර්තිත අනුපාතය නිශ්චය කළ යුතු වීම. | නිවැරදි ක්‍රමවේදයකට අනුව පරිවර්තිත අනුපාතය සකස් කිරීමට කටයුතු සිදු කරයි. |
| (ඇ) | රු.මිලියන 28.16 ක් වැය කර 2016 වර්ෂයේදී මුම්බායි කොන්සල් ජෙනරාල් කාර්යාලය අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවද එම අලුත්වැඩියා කටයුතු | නිසි ප්‍රමිතියක් යටතේ අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු වීම. | ඉදිරියේදී ප්‍රමිතියට අනුව අලුත්වැඩියා කටයුතු කිරීම සම්බන්ධව අමාත්‍යාංශය අවධානය යොමු කරනු ඇත. |

| | | | |
|---|---|---|---|
| | නිසි පරිදි ඉටු නොකිරීම නිසා 2018 වර්ෂයේදී නැවත අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.999,626 ක් වැය කිරීමට සිදුවී තිබුණි. | | |
| (ඇ) | 2004 ජුනි 28 දින නිකුත් කරන ලද අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 194 ප්‍රකාරව බදු නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් වන කාර්තුමය වාර්තාවක් සහ ගෙවන ලද බදු පිළිබඳ විස්තරාත්මක වාර්තා දූත මණ්ඩල කාර්යාල 03 ක් විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තා නිසි පරිදි ගෙන්වා ගැනීමට පියවර ගත යුතු වීම. | අදාළ දූත මණ්ඩල සඳහා අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 194 ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ඉ) | 2018 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල කාර්යාල 03 ක් විසින් ගෙවන ලද එකතුව රු.මිලියන 6.36 ක බදු මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව බදු මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | බදු මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා නව උපදෙස් මාලාවක් නිකුත් කිරීමට බලාපොරොත්තුවේ. |
| (ඊ) | ශ්‍රී ලංකාව හා කැනඩාව 1958 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එළැඹ ඇති ගිවිසුම් 24 කට අදාළව හා ශ්‍රී ලංකාව හා ඩුබායි අතර එළඹ ඇති ගිවිසුම් 11 කට අදාළව ශ්‍රී ලංකාව අත්පත් කර ගෙන ඇති ප්‍රතිලාභ, එම ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය හා එම ගිවිසුම්වල අඩුපාඩු යනාදිය සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හෝ අදාළ දූත මණ්ඩලය සතුව නොතිබුණි. | එළඹෙන ලද ගිවිසුම් සම්බන්ධයෙන් කාලීනව තොරතුරු පවත්වා ගත යුතු වීම. | රටවල් සමඟ අත්සන් කර ඇති ගිවිසුම්වල ප්‍රගතිය හා වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු අදාල රේඛීය අමාත්‍යාංශවලින් ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් අවශ්‍ය බැවින් ඉදිරියේදී පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවේ. |

| | | | |
|---|---|---|---|
| (ළ) | කොන්සියුලර් ජනරාල් කාර්යාලයක් විසින් 2009 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු මෝටර් රථය 2017 වර්ෂයේදී රු.471,518 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. 2018 වර්ෂයේ එන්ජිම ක්‍රියාවිරහිත වීම නිසා අලුත්වැඩියාව සඳහා ගරාජ් ගත කර තිබුණද, 2019 ජුනි 30 දින දක්වා අලුත්වැඩියා කිරීමකින් තොරව වාහනය ගරාජයේ නවතා තිබුණි. එම හේතුවෙන් 2018 සැප්තැම්බර් මස සිට මාසිකව රු.355,230 ක කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබුණි. | වාහනය අලුත්වැඩියා කිරීමට හෝ අමාත්‍යාංශය දැනුවත් කර නිසි ක්‍රියා මාර්ග කිරීමට කටයුතු කිරීම. | මෙම රථය දිගින් දිගටම අලුත්වැඩියා කිරීම ආර්ථිකව ලාභදායි නොවන බව නියෝජිත ආයතනය ද අලුත්වැඩියාව සිදුකළ පුද්ගලික ගරාජය ද මෙන්ම කොන්සල් ජනරාල් කාර්යාලය ද තාක්ෂණික ඇගයීම් වාර්තාව මඟින් අවධාරණය කර ඇත.<br>මෙම වාහනය අපහරණය කිරීම සඳහා කටයුතු කරමින් පවතින අතර නව වාහනයක් මිලදී ගැනීම සඳහා අවධානය යොමු කර ඇත. |
| (ළු) | ඇමරිකා එක්සත් ජනපදය මඟින් පනවා ඇති සම්බාධක හේතුවෙන් ටෙහෙරාන් තානාපති කාර්යාලය සඳහා අක් මුදල් යැවීම ඩුබායි කන්සියුලර් ජනරාල් කාර්යාලය මඟින් සිදුකර තිබුණු අතර, ඒ සඳහා ටෙහෙරාන් තානාපතිවරයාට සෑම මාසයකදීම ඩුබායි රටට පැමිණීමට සිදුව තිබුණි. මෙම ක්‍රියාවලිය අනාරක්ෂිත මෙන්ම අධික වියදම්කාරී ක්‍රියාවක් බව නිරීක්ෂණය වූ අතර,එම ගමනේ ගමන් ටිකට් පත් සහ අනිකුත් දීමනා සඳහා 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙළින් රු.මිලියන 5.12 ක් හා රු.මිලියන 3.83 ක් වැයකර තිබුණි. | ගමන් වියදම හා අනෙකුත් දීමනා අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම ගැටලුව සම්බන්ධයෙන් එහි පසුබිම හා යෝජනා පිළිබඳ දැනුවත් කරමින් සුදුසු උපදෙස් සඳහා 2018 මාර්තු 07 දින ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලිඛිතව දන්වා ඇත. තවද තාවකාලික පිළියමක් ලෙස මෙම අමාත්‍යාංශය විසින් 2019 මැයි 09 වැනි දින සිට ඉදිරි මාස 03 කට ප්‍රමාණවත් අක්මුදල් එකවර ඩුබායි තානාපති කාර්යාලය හරහා ලබාදීමට කටයුතු කර ඇත. |

**4. යහපාලනය**

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලේඛන සහතික කිරීමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා දීම සඳහා 2018 අගෝස්තු 16 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගෙන තිබුණද මෙතෙක් එම කටයුතු විමධ්‍යගතව සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | අවබෝධතා ගිවිසුම අනුව කටයුතු කළ යුතු වීම. | නොබෝ දිනකින් ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා ලේඛන සත්‍යාපනය කිරීමේ විමධ්‍යගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) ශ්‍රී ලංකා නවදිල්ලි මහ කොමසාරිස් කාර්යාලය යටතේ පාලනය වන විශ්‍රාම ශාලාව වෙත පැමිණෙන වන්දනාකරුවන් සම්බන්ධ නාම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. එම හේතුවෙන් විශ්‍රාම ශාලාවෙන් ලැබෙන දෛනික ආදායමට අදාළව නිකුත් කළ රිසිට් පත් ප්‍රමාණයන්ගේ නිවැරදිතාවය හා ලැබුණු සියලුම ආදායම් බැංකු ගත කලේද යන්න තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. තවද එහි රාජකාරි සඳහා කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කර ඇති හිමිහට සහ නිලධාරියෙකු සම්බන්ධයෙන් විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් | නවදිල්ලි මහ කොමසාරිස් කාර්යාලය යටතේ මෙම විශ්‍රාම ශාලාව පවතින බැවින් එය අධීක්ෂණය කළ යුතු වීම. | අමාත්‍යාංශයේ අභ්‍යන්තර අංශය විසින් පරීක්ෂණයක් සිදුකර ඇත. ඒ අනුව ඉදිරි පියවර ගැනීමට බලාපොරොත්තු වනු ඇත. |

අනුගමනය කර නොතිබුණි.

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | 2009 ජුනි 09 දිනැති අංක **DMA/2009/01** දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්විය යුතු වීම. | 2019 වර්ෂය තුළ රැස්වීම් වාර 04 ක් පැවැත්වීමට අවශ්‍ය පියවර ගනු ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හා අතිරික්ත සංඛ්‍යාව පිළිවෙළින් 87 ක් හා 05 ක් වූ අතර, දූත මණ්ඩල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 85 ක් විය. | පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම් තුලින් හා නව බඳවා ගැනීම්වලින් අමාත්‍යාංශයේ හා දූත මණ්ඩල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. |